## සමීක්ෂණ ප්‍රශ්නාවලිය පිරවීම සඳහා උපදෙස්

**ප්‍රශ්න අංක 1 සිට 8** දක්වා ඔබ ආයතනය හඳුනා ගැනීමට තොරතුරු නිවැරදිව සඳහන් කල යුතු අතර, ඔබ ආයතනය සතු ශාඛා වෙනත් ස්ථානයක පිහිටුවා තිබේ නම් ප්‍රශ්න අංක 5 යටතේ "ඔව්" සලකුණු කර එම සංඛ්‍යාව සඳහන් කරන්න. ***ආර්ථික කටයුතු කිහිපයක් සිදු කරන්නේ නම් වැඩි සේවක පිරිසක් යොදා ගෙන කරනු ලබන ප්‍රධාන ආර්ථික කටයුත්ත ප්‍රශ්න අංක 6 යටතේ සඳහන් කරන්න.***

**ප්‍රශ්න අංක 9 -** ඔබ ආයතනයේ පසුගිය මාසය තුල ක්‍රියාත්මක ව පැවති දින ගණන මෙහි සඳහන් කරන්න.

**ප්‍රශ්න අංක 10** - සේවා නියුක්තිය පහත සඳහන් අර්ථ දැක්වීම් උපයෝගී කර ගනිමින් සම්පූර්ණ කරන්න

***පූර්ණ කාලීන සේවකයින්*** :- වැටුපක්, වේතනයක් හෝ කල සේවය සඳහා ගෙවීමක් ලබමින් සතියේ සාමාන්‍ය වැඩ කරන කාලය තුලදී කිසියම් ආර්ථික කටයුත්තක නිරත සේවකයින්. (සතියක් තුල ඔහුගේ සාමාන්‍ය වැඩ කරන පැය ගණන සේවා යෝජකයා විසින් තීරණය කරනු ඇත).

***අර්ධ කාලීන සේවකයින්***:- පූර්ණ කාලීනව අධ්‍යයන කටයුතු වල නිරත ශිෂ්‍යයින් කිසියම් ගෙවීමක් වෙනුවෙන් එම අධ්‍යයන කාලයෙන් පරිබාහිරව ආර්ථික කටයුත්තක නිරත වීම හෝ වෙනත් සේවා ස්ථානයක පූර්ණ කාලීනව සේවය කරන්නන් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව මෙම ආයතනයේ යම් කාල පරිච්ඡේදයක් ගෙවීමක් ලබමින් සේවයෙහි නිරත වේ නම් ඔවුන් අර්ධ කාලීන සේවකයින් ලෙස සලකන්න.

***ක්‍රියාකාරි අයිතිකරුවන් හා ක්‍රියාශීලී හවුල්කරුවන්*** :- ආයතනයේ කටයුතුවල ක්‍රියාශීලී ලෙස නිරත අයිතිකරුවන් හා හවුල්කරුවන් වේ. ඒකකයෙන් පිටත කටයුතුවල නිරත වන අක්‍රිය හවුල්කරුවන් ඇතුලත් නොවිය යුතුය.

***වැටුප් නොලබා සේවය කරන පවුලේ සාමාජිකයින්*** :- අයිතිකරුගේ නිවසෙහි පදිංචිව සිටිමින්, මෙම කාල පරිච්ඡේදය තුල නියමිත වැටුපක් නොලබා අවම ලෙස සාමාන්‍යයෙන් වැඩ කරන කාලයෙන් 1/3 වත් ඒකකයෙහි වැඩ කරන සියළුම සේවකයින් හා අයිතිකරුගේ නිවසෙහි පදිංචි නැති පිටතින් පැමිණි වැටුප් රහිත වැඩ කරන පුද්ගලයින් අයත් වේ.

**ප්‍රශ්න අංක 11**

***ස්ථිර සේවකයින්*** :- ආයතනයේ ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් වන්නන්.

***තාවකාලික සේවකයින්*** :- ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය නොකරන ලද නිත්‍ය පදනමක් මත වැඩ කරන පරිවාසකයින් සහ වෙනත් අය.

***අනියම් සේවකයින්*** :- නොකඩවා රැකියාව දීමට පොරොන්දුවක් නැති වැඩි වශයෙන් දෛනික වැටුප් පදනමක් මත වැඩෙහි නිරතවන්නා වූ කෙටි කාලීන වැඩ සඳහා බඳවා ගෙන ඇති සේවකයින්. පිටස්තර සේවකයින් හෝ ගෙදර සිට වැඩ කරන සේවකයින් මේ යටතේ ඇතුලත් කල යුතුය.

***ඉගෙනගන්නන් සහ ආධුනිකයින්*** :- රැකියාවක් සඳහා පුහුණු කරවන්නන් සහ කරන ලද වැඩ සඳහා වේතන ලබන්නන්.

**සම්මත රැකියා වර්ගීකරණය**

ජාත්‍යන්තර සම්මත රැකියා වර්ගීකරණයට අනුව ඔබ ආයතනයේ සේවයේ නියුතු මුළු පුද්ගලයින් සංඛ්‍යාව පහත පරිදි වර්ග කරන්න.

1. ***කළමනාකරුවන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නීති සම්පාදකයින්***

ආයතනයේ හෝ ව්‍යාපාරයේ හෝ පරිපාලන ඒකකයේ සමස්ත ක්‍රියාකාරකම් සැලසුම් කරමින්, සම්බන්ධීකරණය කරමින් හා ඇගයීම් කරමින් සේවකයින් පරිපාලනය කරන පුද්ගලයින්.

2. ***වෘත්තිකයින්***

විද්‍යාත්මක සහ ශිල්පාත්මක සිද්ධාන්ත හා සංකල්ප යොදා ගනිමින්, තමා තුල පවත්නා දැනුම උපයෝගී කර ගනිමින්, එම දැනුම විධිමත් ලෙස උගන්වමින් හෝ උක්ත ක්‍රියාකාරකම්වල සම්මිශ්‍රණයක් ලෙස ක්‍රියා කරන්නන්.

උදා:- විද්‍යා හා ඉංජිනේරු වෘත්තිකයින්, වෛද්‍යවරුන්, ගුරුවරුන්,ගණකාධිකාරිවරුන්,තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ වෘත්තිකයින් ආදි වශයෙනි.

3. ***තාක්ෂණිකයින් හා ආශ්‍රිත වෘත්තිකයින්***

විද්‍යාත්මක හා ශිල්පාත්මක සංකල්ප හා ක්‍රමවේදයන් උපයෝගී කරගනිමින් හා පර්යේෂණ කරමින් තාක්ෂණික හා ආශ්‍රිත වෘත්තිකයින් ලෙස ක්‍රියාකරන සේවකයින්.

උදා :- විද්‍යා හා ඉංජිනේරු ආශ්‍රිත වෘත්තිකයින්, සෞඛ්‍ය ආශ්‍රිත වෘත්තිකයින්, මූල්‍ය හා ගණිත සහාය වෘත්තිකයින් ඇතුලුව ඉහත වෘත්තිකයින් යටතේ සේවය කරන තාක්ෂණික වෘත්තිකයින්.

4. ***ලිපිකරු හා ලිපිකරු සහාය සේවකයින්***

වාර්තා තබමින්, සංවිධානය කරමින්, ගබඩා කරමින්, ගණන් බලමින් හා ගබඩා කරන ලිපි ලේඛන නැවත පරිශීලනය කරමින් ලිපිකාර සේවයේ යෙදී සිටින සේවකයින්.

5. ***සේවා සහ විකුණුම් සේවකයින්***

ගමනාගමන, ගෘහ පාලනය, ආහාරපාන සැපයීම, පුද්ගලික සුරැකුම් සේවා, පුද්ගලික ආරක්ෂක අංශයන්ට අදාලව සහ වෙනත් සේවාවන් සපයන සේවකයින් සහ වෙළඳ ප්‍රදර්ශකයින්ද ඇතුලුව සිල්ලර හා තොග වෙළඳ ආයතනවල වෙළඳ සේවකයින්.

6. ***පුහුණු කෘෂිකාර්මික, වන සහ ධීවර සේවකයින්***

කෘෂිකාර්මික වගාවන් වැපිරීමේ සිට අස්වනු නෙලීම දක්වා ශ්‍රමිකයින් සහ සත්ව පාලනය, සත්ව නිෂ්පාදනය පිලිබඳ පුහුණු ශ්‍රමිකයින්, විසිතුරු මසුන්/මිරිදිය මසුන් බෝ කිරීම හා රැක බලාගැනීමේ යෙදෙන්නන් හා වනයෙන් බෝග වර්ග, පලතුරු වර්ග, පැල වර්ග රැස් කිරීමේ යෙදෙන්නන්, ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර කාර්මිකයින්, සතුන් දඩයම් කිරීම වැනි කටයුතු සම්බන්ධ පුහුණු ශ්‍රමිකයින්.

7. ***ශිල්පීය සහ ආශ්‍රිත කර්මාන්ත සේවකයින්***

අදාල ක්ෂේත්‍රයේ විශේෂිත වූ දැනුම සහ නිපුණතා යොදා ගනිමින් ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව, ලෝහ සකස් කිරීම, ලෝහ සැකිලි ඉදිකිරීම, යාන්ත්‍රික උපකරණ සෑදීම හෝ සවිකිරීම, එකලස් කිරීම, යන්ත්‍ර, යාන්ත්‍රික උපකරණ අළුත්වැඩියාව සහ නඩත්තුව, මුද්‍රණ කර්මාන්තයේ නිෂ්පාදන, ආහාර ද්‍රව්‍ය සැකසීම, හස්ත කර්මාන්තයද ඇතුලුව රෙදි කර්මාන්තයේ හෝ ලෝහ ද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිෂ්පාදනයේ නියැලෙන සේවකයින්. මෙම ක්‍රියාවන්හි නියැලෙන සෙවකයින් සම්පූර්ණයෙන්ම අතින්ම හෝ අතින් ක්‍රියාකරන යන්ත්‍ර හෝ වෙනත් උපකරණ භාවිතා කල හැක.

8. ***යන්ත්‍රාගාර හා යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ එකලස්කරුවන්***

කාර්මික හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සියළුම යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවන්නන් සහ අවධානය යොමු කරන්නන්. දුම්රිය, අහස්යානා, මුහුදු යාත්‍රා ඇතුලු සියළුම රථවාහන රියදුරන් සහ ක්‍රියාකරවන්නන්, කිසියම් විශේෂිත වූ ක්‍රමවේදයන් යොදා ගනිමින් යන්ත්‍ර හෝ උපකරණ කොටස් අමුණන්නන් හා එකලස්කරුවන්.

9. ***මූලික රැකියාවන්***

අතින් මෙහෙයවන ලබන උපකරණ හා සැලකිය යුතු ශාරීරික ශක්තියක් භාවිතා කරමින් යෙදෙන මූලික රැකියාවන්. පුරුද්දක් වශයෙන් කරගෙන යනු ලබන රැකියාවන් සහ පහසු කාර්යයන්හි යෙදෙන නුපුහුණු කම්කරුවන් මේ යටතේ ගැනේ.

**ප්‍රශ්න අංක 11 (සම්බන්ධයි....)**

*දිනකට වැඩ කරන පැය ගණන* :- අතිකාල පැය ගණන ද සහිත ව එක් සේවකයෙකු සාමාන්‍යයෙන් දිනකට වැඩ කරන පැය ගණන මෙහි සඳහන් කරන්න.

*සතියකට වැඩ කරන පැය ගණන* :- අතිකාල පැය ගණන ද සහිත ව එක් සේවකයෙකු සාමාන්‍යයෙන් සතියක දී වැඩ කරන පැය ගණන මෙහි සඳහන් කරන්න.

*දැනට සතියකට යෙදවෙන සාමාන්‍ය අතිකාල පැය ගණන :- එක් සේවකයෙකු සතියක් තුල වැඩ කරන අතිකාල පැය ගණනේ සාමාන්‍යය (එනම්, සතියක දී දෙනු ලබන අතිකාල පැය ගණන අතිකාල සේවයේ යෙදුණු සේවක සංඛ්‍යාවෙන් බෙදන්න.)*

**ප්‍රශ්න අංක 12**

*ආයතනයේ අයිතිකරුවන්/සේවායෝජක සහ ක්‍රියාශීලී හවුල්කරුවන් ආයතනයේ කටයුතු සඳහා ක්‍රියාකාරීව දායක වන්නේ නම් අංක 1 කව කර එක් අයෙකු සාමාන්‍යෙයන් සතියක දී වැඩ කරන පැය ගණන සඳහන් කරන්න.*

*නොඑසේනම් අංක 2 කවකරන්න.*

**ප්‍රශ්න අංක 13**

*ආයතනයේ සේවක පුරප්පාඩු තිබේ නම් අංක 1 කව කර ප්‍රශ්න අංක 14 වෙත යන්න.*

*නො එසේ නම් අංක 2 කව කර ප්‍රශ්න අංක 15 වෙත යන්න*

**ප්‍රශ්න අංක 14**

*ප්‍රශ්න අංක 11 හි සඳහන් රැකියා වර්ගී කරණයට අදාල ව ඔබගේ ආයතනයේ පුරප්පාඩුව පවත්නා රැකියා වර්ග 5ක් පුරප්පාඩු සංඛ්‍යාවද සහිත ව ප්‍රමුඛතාවය අනුව මෙහි සඳහන් කරන්න*

**ප්‍රශ්න අංක 15**

ගෙවන ලද මූලික වැටුප් : *අදාල රැකියාවන් හි නියුතු සේවකයන්ගේ මූලික වැටුප් (Basic Salary) වල එකතුව මෙහි සඳහන් කරන්න*

ජීවන අංක දීමනාව/ඒ හා සමාන වෙනත් දීමනා : *ජීවන අංකය සහ ඒ හා සමාන වෙනත් දීමනා සඳහා සේවකයන් වෙනුවෙන් ගෙවනු ලබන මුදලෙහි එකතුව මෙහි සඳහන් කරන්න*

අතිකාල දීමනා : *සේවකයන් සඳහා ගෙවනු ලබන අතිකාල දීමනාවන් හි එකතුව මෙහි සඳහන් කරන්න*

**ප්‍රශ්න අංක 16 (මාසික වැටුප් සහ අතිකාල දීමනා හැර ආයතනය විසින් සේවකයන් වෙනුවෙන් දරණ අමතර වියදම්)**

සමාජ ආරක්ෂණ EPF ETF ආදිය ප්‍රවාහනය සඳහා දරණ ලද වියදම් } *පසුගිය මාසය ට අදාල තොරතුරු සඳහන් කරන්න*

ආහාර/නිල ඇඳුම්/නවාතැන් /නිල නිවාස සෞඛ්‍ය සේවා } *සාමාන්‍ය මාසික වියදම සඳහන් කරන්න*

පුහුණු වැඩසටහන් / වැඩමුළු ආදිය : *පසුගිය වසර තුල දරණ ලද වියදම්වල එකතුව සඳහන් කරන්න*

**ප්‍රශ්න අංක 17**

පසුගිය වසර තුලදී ආයතනය විසින් සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් දරණ ලද වෙනත් වියදම් මෙම කොටස යටතේ ඇතුලත් කරන්න.

*සටහන : පසුගිය මාසය යනු ප්‍රශ්නාවලියේ මුල් පිටුවේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් මාසය බව කරුණාවෙන් සලකන්න*